## තාක්ෂණය සමඟ බැදි ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව වර්ගීකරණය සහ අර්ථ දැක්වීම්

**ටී 1- රූප පාදක කරගත් ලිංගික අපයෝජනය**

| කේත අංකය | වර්ගය | මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම |
|---|---|---|
| **ටී 1.1** | **කැමැත්තකින් තොරව සමීප රූප බෙදා හැරීම.** | මුලින් කැමැත්ත සහිතව නිර්මාණය කරන ලද හෝ බෙදා හරින ලද පුද්ගලයෙකුගේ සමීප හෝ ලිංගික රූප පසුව කැමැත්තකින් තොරව බෙදා ගැනීම, බෙදා හැරීම හෝ භාවිතය. තර්ජනයට ලක් වූ බෙදා හැරීම්ද වාර්තා කළ යුතුය. |
| **ටී 1.2** | **රහසිගත ලිංගික රූප ගැනීම.** | රහසිගතව ගන්නා ලද ලිංගික රූප ("ක්‍රීප්ෂොට්ස්") ඇතුළුව, පුද්ගලයෙකුගේ අනුදැනුමකින් හෝ කැමැත්තකින් තොරව සමීප හෝ ලිංගික ඡායාරූප/වීඩියෝ ගැනීම, පටිගත කිරීම හෝ ලබා ගැනීම. |
| **ටී 1.3** | **ඉල්ලීමක් නොකර හෝ කැමැත්තක් නොමැතිව, එවන ලද ලිංගික අන්තර්ගතයන්** | පුද්ගලයෙකුගේ අවසරයකින් තොරව ඩිජිටල් තාක්ෂණය හරහා ලිංගික, ඉතා පැහැදිලි හෝ අසභ්‍ය රූප යැවීම. |
| **ටී 1.4** | **වෙනස් කරන ලද, ව්‍යාජ, හෝ කෘතිම බුද්ධිය ඇසුරෙන් නිර්මාණය කරන ලද ලිංගික අන්තර්ගතයන්** | අනුමැතියකින් තොරව, ලිංගික අන්තර්ගතයන්වල පුද්ගලයෙකු ව්‍යාජ ලෙස නිරූපණය කිරීම සඳහා රූපයක්, වීඩියෝවක් හෝ ශ්‍රව්‍ය පටිගත කිරීමක්, කෘතිම බුද්ධිය ඇතුළුව වෙනත් මාධ්‍ය හරහා නිර්මාණය කිරීම, වෙනස් කිරීම හෝ හැසිරවීම. |
| **ටී 1.5** | **කැමැත්තකින් තොරව රූප ලිංගිකකරණය හෝ රූප නිරාවරණය කිරීම. (ඉහත ටී 1.1 සිට ටී 1.4 දක්වා කාණ්ඩ කිසිවක් තුළට නොවැටෙන රූප පාදක කරගත් අපයෝජනය)** | ස්වභාවයෙන් ලිංගික හෝ රහස්‍ය ලෙස නොසැලකිය හැකි, පුද්ගලයෙකුගේ හෝ එම පුද්ගලයාගේ ශරීරයේ ඕනෑම කොටසක හෝ කොටස්වල රූපයක් ඔවුන්ගේ කැමැත්තෙන් තොරව ලිංගිකමය, මෙවලමක් ලෙස සලකන, පහත් කොට සලකන, පුද්ගලිකත්වයට හානි කරන හෝ සංස්කෘතික හෝ ආගමික වශයෙන් හානිකර |

| | | |
|---|---|---|
| | | සන්දර්භයක් තුළ බෙදා හැරීම, භාවිතා කිරීම හෝ ඉදිරිපත් කිරීම. |

ටී 2 - ලිංගික බලහත්කාරය සහ සූරාකෑම

| කේත අංකය | වර්ගය | මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම |
|---|---|---|
| **ටී 2.1** | **ලිංගික ප්‍රචණ්ඩත්වය / ලිංගික බියවැද්දීම /ලිංගික අල්ලස්** | සමීප රූප හෝ පෞද්ගලික ලිංගික තොරතුරු භාවිතා කරමින් මුදල්, ලිංගික ක්‍රියාවන්, තවදුරටත් සමීප දර්ශන හෝ වෙනත් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තාක්ෂණය ඔස්සේ කරනු ලබන තර්ජනය කිරීම් |
| **ටී 2.2** | **පුද්ගලයෙකු තුළ විශ්වාසයක් ගොඩ නගා, ඔවුන්ව ලිංගික සූරා කෑමට ලක් කිරීම / තාක්ෂණය ඔස්සේ සිදුවන ලිංගික සූරාකෑම.** | දරුවෙකු හෝ තරුණයෙකු ඇතුළු ඕනෑම පුද්ගලයෙකු සමඟ විශ්වාසයක්, චිත්තවේගීය බැඳීමක් හෝ සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින්, එම පුද්ගලයාව ලිංගික සූරාකෑම සඳහා බඳවා ගැනීමට, හැසිරවීමට, බලහත්කාරයෙන් කටයුතු කිරීමට, ලිංගික සූරාකෑම සඳහා පහසුකම් සැලසීමට, ප්‍රචාරය කිරීමට, සංවිධානය කිරීමට හෝ ඉන් ලාභ ලැබීමට ඩිජිටල් මාධ්‍යයන් භාවිතා කිරීම. |

ටී 3 - හිරිහැර, බිය ගැන්වීම් සහ තර්ජන

| කේත අංකය | වර්ගය | මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම |
|---|---|---|
| **ටී 3.1** | **මාර්ගගත / සයිබර් අවකාශයේ හිරිහැර කිරීම / සයිබර් අවකාශයේ පීඩා කිරීම / කෝප ගන්වන සුළු අන්තර්ගතයන් සයිබර් අවකාශයේ මුදා හැරීම.** | පහත්, අහිතකර හෝ අපහාසාත්මක සන්නිවේදනයන් හෝ රූප ඇතුළුව, පුද්ගලයෙකුට තර්ජනය කරන, හිරිහැර කරන, පුද්ගලයෙකු බිය ගන්වන හෝ අපයෝජනය කරන, තාක්ෂණය ඔස්සේ නැවත නැවත සිදුවන හැසිරීම්. |
| **ටී 3.2** | **තාක්ෂණය ඔස්සේ සිදුවන ලිංගික හෝ ශාරීරික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ තර්ජන** | බලපෑමට ලක් වූ පුද්ගලයාට හෝ ඔවුන්ට සම්බන්ධ වෙනත් පුද්ගලයෙකුට ශාරීරිකව හෝ ලිංගිකව හානි කිරීමේ චේතනාවක් හෝ තර්ජනයක් |

| | | |
|---|---|---|
| | | ඩිජිටල් මාධ්‍ය හරහා සන්නිවේදනය කිරීම. |
| **ටී 3.3** | **ඩිජිටල් අවකාශයේ ලිංගික බියවැද්දීම / කප්පම් ගැනීම.** | මුදල් ලබා දීමට, යම් ක්‍රියාවක් කිරීමට, යම් ක්‍රියාවක් කිරීමෙන් වැළකී සිටීමට හෝ ඉල්ලීමකට අනුකූල වීමට යම් පුදගලයෙකු පොළඹවමින්, යමක් හෙළිදරව් කිරීම සඳහා, පුද්ගලයෙකුගේ කීර්ති නාමයට හානි කිරීම සඳහා හෝ වෙනත් අහිතකර ප්‍රතිවිපාක ඇති කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම. |

**ටී 4 - ලුහුබැඳීම, නිරීක්ෂණය සහ තාක්ෂණය ඔස්සේ සිදු කරනු ලබන බලහත්කාර පාලනය**

| **කේත අංකය** | **වර්ගය** | **මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම** |
|---|---|---|
| **ටී 4.1** | **සයිබර් අවකාශයේ ලුහුබැඳීම.** | තාක්ෂණික ක්‍රම හරහා නිරන්තරයෙන්, අනවශ්‍ය ලෙස හෝ තර්ජනාත්මකව පුද්ගලයෙකු සෝදිසි කිරීම, සම්බන්ධ කර ගැනීම හෝ ලුහුබැඳීම. |
| **ටී 4.2** | **ඩිජිටල් අවකාශයේ නිරීක්ෂණය / අධීක්ෂණය / තාක්ෂණය ඔස්සේ සිදු කරනු ලබන බලහත්කාර පාලනය / ප්‍රවේශ පාලනය** | අනුමැතියකින් තොරව හෝ අපයෝජනයේ හෝ පාලනයේ කොටසක් ලෙස වෙනත් පුද්ගලයෙකුගේ සන්නිවේදනයන්, ක්‍රියාකාරකම් හෝ හැසිරීම නිරීක්ෂණය කිරීමට ඩිජිටල් උපාංග, ගිණුම්, යෙදුම් හෝ වෙනත් තාක්ෂණයන් භාවිතා කිරීම. |

**ටී 5 - පෞද්ගලිකත්වය සහ හෙළිදරව් කිරීමේ අපයෝජනය**

| **කේත අංකය** | **වර්ගය** | **මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම** |
|---|---|---|
| **ටී 5.1** | **ඩොක්සිං (Doxxing)** | යම් පුද්ගලයෙකුට හානියක් , බිය ගැන්වීමක් හෝ හිරිහැරයක් ඇති කළ හැකි පරිදි, එම පුද්ගලයාගේ කැමැත්තකින් තොරව, එම පුද්ගලයා සම්බන්ධ කරගත හැකි තොරතුරු, ඔවුන්ගේ |

| | | |
|---|---|---|
| | | ලිපිනය, සේවා ස්ථානය හෝ පවුලේ තොරතුරු වැනි පුද්ගලික හෝ සංවේදී තොරතුරු ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම. |
| **ටී 5.2** | අවුට්ං **(Outing)** | යම් පුද්ගලයෙකුගේ කැමැත්තෙන් තොරව, ඔවුන්ගේ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය හෝ ලිංගික ලක්ෂණ තාක්ෂණය හරහා අන් අය වෙත හෝ ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම. |

**ටී 6 - අනන්‍යතා, ගිණුම් සහ ප්‍රවේශ අපයෝජනය**

| කේත අංකය | වර්ගය | මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම |
|---|---|---|
| **ටී 6.1** | මාර්ගගත අනුකරණය/ව්‍යාජ ගිණුම් | යම් පුද්ගලයෙකුගේ කීර්ති නාමයට හෝ ආරක්ෂාවට හානි පැමිණවීමට, ඔවුන් රැවටීමට, බිය ගැන්වීමට, සූරාකෑමට ලක් කිරීමට, ඔවුන්ගේ අනන්‍යතාවය ව්‍යාජ ලෙස දක්වන මාර්ගගත පුද්ගල විස්තරයක් හෝ ගිණුමක් නිර්මාණය කිරීම හෝ භාවිතා කිරීම. |
| **ටී 6.2** | හැක් කිරීම/ගිණුම් අත්පත් කර ගැනීම | සමාජභාවය මත පදනම් වූ අපයෝජනයක් සිදු කරන හෝ ඊට පහසුකම් සලසන ලෙස පුද්ගලයෙකුගේ ඩිජිටල් ගිණුමට, උපාංගයට හෝ දත්ත වලට අනවසරයෙන් ප්‍රවේශ වීම, ඒවාට මැදිහත් වීම හෝ ඒවා පාලනය කිරීම. |

**ටී 7 - සමාජභාවය මත පදනම් වූ වෛරය, සමාජභාවය මත පදනම් වූ කෝප ගැන්වීම සහ කීර්ති නාමයට හානි කිරීම.**

| කේත අංකය | වර්ගය | මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම |
|---|---|---|
| **ටී 7.1** | සමාජභාවය සහ ලිංගිකකරණය මත පදනම් වූ මාර්ගගත වෛරී කථා | සමාජභාවය හෝ වෙනත් අනන්‍යතා සාධකයක් මත පදනම්ව පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට අපහාසාත්මක හෝ වෙනස් කොට සලකන භාෂාවක් භාවිතා කරමින් සිදු කරන මාර්ගගත |

| | | |
|---|---|---|
| | | සන්නිවේදනය; ලිංගිකත්වය මත පදනම්ව වෛරය පතුරුවන, ප්‍රවර්ධනය කරන, උසිගන්වන හෝ සාධාරණීකරණය කරන ලිංගික වෛරී කථා. |
| **ටී 7.2** | **සමාජභාවය මත පදනම් වූ කෝප ගැන්වීම** | විශේෂයෙන් නින්දාවට පත් කිරීමේ, බිය ගැන්වීමේ හෝ නිහඬ කිරීමේ අදහසින් සමාජභාවය, සමාජභාවී ප්‍රකාශනය, ස්ත්‍රීවාදී අදහස් හෝ සමාජභාවය පිළිබඳ සම්මතයන් උල්ලංඝනය කළ බවට සැලකීම මත, පුද්ගලයෙකු ඉලක්ක කර ගනිමින් කරනු ලබන අපයෝජිත, විරුද්ධවාදී හෝ ප්‍රකෝපකාරී මාර්ගගත හැසිරීම. |
| **ටී 7.3** | **සමාජභාවය මත පදනම් වූ වැරදි තොරතුරු සැපයීම් / ලිංගිකකරණය කළ කීර්තිනාම අපයෝජනය** | පුද්ගලයෙකු රැවටීමට හෝ පුද්ගලයෙකුගේ කීර්ති නාමයට, විශ්වසනීයත්වයට, ආරක්ෂාවට හෝ සහභාගීත්වයට හානි කිරීමේ අදහසින් හිතාමතා නිර්මාණය කරන ලද හෝ බෙදා හරින ලද ව්‍යාජ තොරතුරු, කතා හෝ අන්තර්ගතයන්. මෙම ප්‍රහාරයේදී සමාජභාවය හෝ සමාජභාවය පිළිබඳ ඒකාකෘති මූලික වේ. |

**ටී 8 - වෙනත්, මතු වෙමින් පවතින හෝ වර්ගීකරණය නොකළ තාක්ෂණය සමඟ බැඳි ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය**

| කේත අංකය | වර්ගය | මෙම පර්යේෂණය සඳහා අර්ථ දැක්වීම |
|---|---|---|
| **ටී 8.1** | **වෙනත්, මතු වෙමින් පවතින තාක්ෂණය සමඟ බැඳි ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය** | තාක්ෂණය සමඟ බැඳි ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි නිර්වචනය තෘප්තිමත් කරන නමුත්, ටී1 සිට ටී7 මඟින් ප්‍රමාණවත් ලෙස ග්‍රහණය කර නොගත්, තාක්ෂණය සමඟ බැඳි සමාජභාවය පදනම් කරගත් හැසිරීම. පසුකාලීන වර්ගීකරණ සමාලෝචනය |

| | | |
|---|---|---|
| | | සඳහා කෙටි විස්තරයක් සටහන් කරන්න. |
| **පී 8.2** | **වර්ගීකරණය කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු නොමැත.** | ලබා ගත හැකි තොරතුරු මගින් තාක්ෂණය සමඟ බැදි ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයක් විය හැකි බව පෙන්නුම් කරන නමුත්, නිවැරදි කාණ්ඩයකට දැමීමට තරම් ප්‍රමාණවත් තොරතුරු නොමැත. |